**රියෝ + 20 සමුළුවේ** (Rio+20 Conference) ප්‍රතිඵලයක් ලෙස මෙම තිරසර සංවර්ධන අභිමතාර්ථ ගොඩනැගීම ආරම්භ විය. මෙම සියළුම අභිමතාර්ථ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ වල ඉදිරි පියවරක් වන අතර 2015 වසරේ සිට 2030 දක්වා පැතිර පවතින අතර තිරසර සංවර්ධන අභිමතාර්ථ 17ක් පවතී. මෙහිදී සියළුම අංශ අන්තර්ගත සහ පැහැදිලි අනතර්ජාතික ක්‍රියාදාමයක් වන අතර සියළුම පාර්ශවකරුවන් සඳහා විවෘත වේ. ඒ වගේම දුප්පත්කම දුරලීම, සමෘද්ධිමත් පරිසරයක්, සියලු දෙනාගේම සුබසාධනය, පරිසර සංරක්ෂණය මූලික වේ.

**තිරසර සංවර්ධන අභිමතාර්ථ**

**01 කොතැනක හෝ පවතින ඕනෑම ආකාරයකින් වන දුගී බව අවසන් කිරීම**





2030 වන විට ලෝකයේ වෙසෙන සියළුම පුද්ගලයින්ගේ දෛනික අදායම ඩොලර් 1.25 වඩා වැඩිකිරීම සහ ජාතික නිර්නායකයන්ට අනුකූලව දිළිදුකමින් පෙළෙන කාන්තා,පිරිමි ළමුන් ප්‍රමාණයෙන් 50% ක් අවම කිරීම යනදිය මෙහි ඉලක්කයන් අතර වේ.




මෙහිදි වෛද්‍ය සේවාවන්හි සමාජීය සේවාවන් සඳහා පහසු ප්‍රවේශයන් ඇති කිරීම, සමාජයේ වෙසෙන සියළුදෙනාම සේවානියුක්තිකයන් බවට පත්කිරීම, සමාජ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා සම්පත් වෙන් කරවීම තහවුරු කිරීම හා එමගින් දිළිදු පුද්ගලයින් හටද මූලික සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අවස්ථාවන් ඇතිකෙරේ.

**02 කුසගින්න නැතිකිරීම, ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම හා සෞඛ්‍ය ප්‍රවර්ධනය, තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය**




2030 වනවිට කුඩා ළදරුවන් ඇතුළුව, දිළිදු පුද්ගලයන්, අසරණ වූ පුද්ගලයින්ට පෝෂණය, ආරක්ෂාවීමට හා ප්‍රමාණවත් අහාර වසර පුරාවට ලැබෙන බවට තහවුරු කිරීම හා දිළිදුකම පිටු දැකීම.




ඉඩම්, අනෙකුත් ඵලදායි සම්පත් සහ අමුද්‍රව්‍ය, දැනුම, මූල්‍ය සේවාවන්, වෙළදපොළ, වටිනාකම් එකතුකිරීම සහ කෘෂිකාර්මික නොවන අංශ වල සේවාවන් සඳහා ආරක්ෂිත සහ සමාන සමාන ප්‍රවේශවීම් හැකියාවන් ලබාදෙමින් සුළු පරිමාණ අහාර නිපදවන්නන්ගේ, කාන්තාවන්ගේ, ස්වදේශීය මිනිසුන්ගේ, ගෙවතු වගාකරුවන්ගේ, ගැමියන්ගේ සහ ධීවරයින්ගේ අදායම සහ කෘෂිකාර්මික ඵලදායිතාවය 2030 වනවිට දෙගුණ කිරීම යනාදිය මෙහි ඉලක්කයන් අතර වේ.


WORLD'S LARGEST LESSON
MAS CHANGE IS COURAGE
Eco go beyond EMPOWERING GENERATION NEXT WITH SUSTAINABILITY

ඉහත ඉලක්කයන්ට අනුකූලව ළමුන්ට, මව්වරුන්ට, වයස්ගත පුද්ගලයින්ට සමාජීය වැඩසටහන් දියුණු කිරීම තුලින් මන්ද පෝෂණය පිටු දැකිමට හැකි වනු ඇත. ඒ වගේම තිරසර කෘෂිකාර්මික වැඩසටහන් යටතේ නියගයන්, ගංවතුර සහ අනෙකුත් විනාශයන් ඇතිවීම වළක්වාලීමට අවස්ථාව ලැබේ.

ගෘහස්ථ හා වන සම්පත් ආරක්ෂාකිරීම සහ එමගින් ලැබෙන ප්‍රතිලාභ සධාරණව බෙදාහැරීම සිදුවේ.

## 03 සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් තහවුරු කිරීම හා සියල්ලන්ටම සෑම වයසකදීම සුභසාධනය ඇතිකිරීම

2030 වන විට මාතෘ මරණ අනුපාතය සජීවී උපත් 100,000කට 70 ක් දක්වා අවම කිරීම.




ජාතික උපායමාර්ග වලට ප්‍රජනණ සෞඛ්‍ය ඇතුලත් කරමින්, පවුල් සැලසුම්, තොරතුරු සහ අධ්‍යාපනය ඇතුලත් කරමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ප්‍රජනණ සෞඛ්‍ය ආරක්ෂක සේවාවන් සඳහා 2030 වන විට ගෝලිය ප්‍රවේශවීම් ඇතිකිරීම කිරීම යනාදිය මෙහි ඉලක්කයන් අතර වේ.




ඒ වාගේම මෙහිදී ජලාශ්‍රිත වැළදෙන රෝග, සෙංගමාලය වැනි රෝග සහ HIV වැනි වසංගත රෝග නිවාරණය කිරීම සහ සියළු දෙනාහටම මනා සෞඛ්‍ය තත්වයන් පවත්වාගෙන යාමට, උසස් සෞඛ්‍ය සේවාවන්, පහසුවෙන් ලබාගතහැකි බෙහෙත් සහ එන්නත් ලබාගැනීමේ තත්වයන් වැනි පසුබිම් සකස්කිරීම.

## 04 සියල්ලන්ම සඳහා සමානාත්මතාවයෙන් යුතු අධ්‍යාපනයක් ලබාදීම තහවුරු කිරීම හා සෑම දෙනාටම ජීවිත කාලය පුරාම ඉගෙනීම සඳහා දිරිගැන්වීම




පූර්ණ නිදහස් සධාරණ හා ගුණාත්ව ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ලබාදෙමින් එහි ඵලදායී ප්‍රතිඵල ලබාගැනීමට 2030 වනවිට සියළුම පිරිමි හා ගැහැණු ළමුන් සඳහා මංපෙත් විවරකිරීම.

විශ්වවිද්‍යාල ඇතුලුව, පහසුවෙන් ලබාගතහැකි උසස් තාක්ෂණික, වෘත්තිමය හා තෘතීයික අධ්‍යාපනයක් සඳහා 2030 වනවිට සියළුම පිරිමි හා ගැහැණු හට අවකාශය සැලැස්වීම යනාදිය මෙහි ඉලක්කයන් අතර වේ.



මෙහිදී ආරක්ෂිත සහ මනා පරිසරය සියලු දෙනාටම සඳහා පාසල් පහසුකම් වැඩිදියුණු කිරීම, පුහුණු කරන ලද ගුරුවරු කණ්ඩායම් ඇතිකිරීම තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය ප්‍රචලිත කිරීම සිදුවේ.

**05 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇතිකිරීම තහවුරු කිරීම හා සියලුම ගැහැණු දරුවන් හා කාන්තාවන් බල ගැන්වීම**




සෑම තැනකම සිදුවන සියළුම කාන්තාවන්ට හා ගැහැණු දරුවන්ට සියලුම අකාරයේ සිදුවන වෙනස්ලෙස සැළකීම නවතා දැමීම.

නිවසේදී කාන්තාවන්ගේ කටයුතු සඳහා වටිනාකමක් ලබාදීම සහ හඳුනාගැනීම යනාදිය මෙහි ඉලක්කයන් අතර වේ.




මෙහිදී සියළු කාන්තාවන්ට හා ගැහුණු දරුවන්ට රාජ්‍ය, දේශපාලන හා ආර්ථිකයේ ක්‍රියාකාරීව නිරතවීමට සමාන අවස්ථාවක් සලසාදීමට දිරිගැන්වීම. පවුල් සෞඛ්‍ය සඳහා කාන්තා අයිතීන් සරුකීම. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රචලිත කිරීම

**06 සැමටම ජලය හා සනීපාරක්ෂාව ලබාදීම තහවුරු කිරීම හා එහි තිරසාර කළමනාකාරීත්වය**




සියළු දෙනාටම ආරක්ෂිත සහ ලගාවිය හැකි පානීය ජලය සඳහා ගෝලියව සධාරණ ප්‍රවේශයන් 2030 වන විට ඇති කිරීම.
දූෂණය අවම කරමින්, හානිකර ද්‍රව්‍ය සහ රසායනික පරිසරයට මුදාහැරීම් නැති කරමින්, පිරිපහදු නොකළ අප ජලය මුදාහැරීම් හරි අඩකින් අවම කිරීම සහ ජලය නැවත භාවිතය සහ ජල ප්‍රතිචක්‍රීකරණය ප්‍රතිශතය ඉහල නංවමින් ජලයේ ගුණාත්වය 2030 වනවිට දියුණු කිරීම.




තිරසර ජල ලබාගැනීම් හා මිරිදිය සැපයුම් මගින් සියළුම අංශවල ජල භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම තුලින් ජල හිඟයට විසඳුම් සෙවීම සහා එමගින් ජල හිඟයෙන් පීඩා විඳින පිරිස අවම කරගැනීම.
2020 වනවිට ජලය සමග බැඳී පවතින පරිසර පද්ධති වන ගංගා, වැව්, කදු, වනාන්තර, තෙත්බිම් හා වගුරු බිම් ආරක්ෂා කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම මෙහි ඉලක්කයන් අතර වේ.

ප්‍රජාව අතර ජල කළමණාකරනය සහ සනීප ආරක්ෂාව පිළිබද දැනුම වැඩිදියුණු කිරීම

### 07 සැමටම ලබාගත හැකි විශ්වාසනීය තිරසාර සහ නවීන කාලීන බලශක්තියට ප්‍රවේශය තහවුරු කිරීම

බොහොමයක් සම්පත් ගැන සඳහන් කළද බලශක්තියද ඉතාවැදගත් වන්නේ සියලු නිෂ්පාදන කටයුතු කිරීම සඳහා බලශක්තිය අවශ්‍ය වන බැවිනි.




ලබාගතහැකි, විශ්වසනීය, නවීන බලශක්ති සේවාවන් සඳහා ගෝලීය ප්‍රවේශයන් 2030 වනවිට ඇතිකිරීම.
2030 වනවිට ගෝලිය බලශක්ති මිශ්‍රණයට පුණර්ජනනය වන බලශක්ති ප්‍රභවයන් (සුලං බලය, හිරු එළිය, වැනි) සැලකියයුතු ප්‍රමාණයකින් වර්ධනයකිරීම.
බලශක්ති කාර්යකෂමතාවය දියුණුකිරීමේ වේගය 2030 වනවිට දෙගුණ කිරීම. උදාහරණ ලෙස වර්ථමානයේ විදුලිපහන් නිෂ්පාදකයින් එක් ඒකකයකින් ලබාගතහැකි විදුලි ආලෝක ප්‍රමාණය දිනෙන් දින ඉහළ දැමීම සඳහා නව නිෂ්පාදන බිහිකිරීම.

මෙහිදි බලශක්තිය කාර්යක්‍ෂම බාවිතය හා ආරක්‍ෂාකිරීම පිළිබද දැනුම ප්‍රචලිත කිරීම සිදුවේ.

### 08 තිරසාර ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම ආධාර කිරීමට හා සැමට පූර්ණ ඵලදායි රැකියා සහ වැදගත් කර්මාන්ත ආරම්භ කිරීම




සංවර්ධනය නොවු රටවල දේශිය නිෂ්පාදන වර්ධනවේගය 7% මට්ටමක පවත්වාගෙන යාම, පොදුතත්වයන් වලට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධන වේගය යහපත්ව පවත්වාගෙනයාම.
විවිධාංගීකරණය, තාක්‍ෂණික යාවත්කාලින කිරීම්, නවොත්පාදන තුලින් ඉහළවටිනාකම් එකතුකිරීමෙන් ශ්‍රමය පදනම් කරගෙන කටයුතු කරන අංශ ඔස්සේ ආර්ථිකයේ උසස් ඵලදායි මට්ටමක් ලගාකරගැනීම.
ඵලදායී කටයුතු වලට, යොග්‍ය රැකියා නිර්මාණය කිරීමට, ව්‍යවසායකත්වයට, නිර්මාණශීලීත්වයට සහ නවොත්පාදනයට සහය දක්වන සංවර්ධනාත්මක ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම.
රැකියාවල, අධ්‍යාපනයේ, පුහුණුවීම්වල නියුතු නොවන පිරිස 2020 වන විට සැලකිය යුතු ප්‍රමාණයකින් අවම කිරීම. ඒවගේම බාලවයස්කාර සේවයේ යෙදීම සහ ළමා සොල්දාදුවන් බඳවාගැනීම වැළකීම.


## 09 ඔරොත්තු දෙන යටිතල පහසුකම්, තිරසාර කර්මාන්තකරණයක් හා නව්‍යකරණයන් ඇතිකිරීම

සමාගම් විසින් තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කළයුතු අතර ව්‍යාපාර කටයුතු කිරීමේදී පරිසරයට හානි නොවිය යුතුය.




රටවල් වල අවශ්‍යතාවයන් මත තාක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම හා ඒ සඳහා සම්පත් වෙන් කිරීම අනිවාර්‍ය වීම.

2020 වන විට සියලු දෙනාටම අන්තර්ජාලය හා නව තාක්ෂණයට ප්‍රවේශවීමට අවස්ථාවන් ඇතිකිරීම, විශේෂයෙන්ම සංවර්ධනය නොවූ රටවල් වල ජීවත්වෙන පුද්ලයින්ට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.




සුළුපරිමාණ කර්මාන්ත වල දියුණුව සඳහා ණය පහසුකම් හා තාක්‍ෂණික සහය ලබාදීම යනාදිය මෙහි ඉලක්කයන් වේ.

## 10 රටවල් අතර ඇති අසමානතාවයන් අවම කිරීම





අසාධාරණ හා නොගැලෙපෙන නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් තුරන්කරමින් ඒ සඳහා යෝග්‍ය නිතී රෙගුලාසි ප්‍රතිපත්ති ප්‍රචලිත කිරීමෙන් අසාමානාතමතාවය අවම කිරීම සහ සමාන අවස්ථාවන් සඳහා ප්‍රවේශයක් ඇතිකර ලිම. ශක්තිමත් රෙගුලාසි ක්‍රියාවට නැංවීම මගින් ලෝක මූල්‍ය වෙළඳපොළ සහ මූල්‍ය ආයතන වල රෙගුලාසි දියුණුකිරීම සහ පාලනය කිරීම යනාදිය මෙහි ඉලක්කයන් අතර වේ.




සීග්‍ර සහ තිරසර ආර්ථික වර්ධනයක් කරා යාමට අවශ්‍ය සහය ලබාගැනීමට දුප්පත් රටවල් සඳහා සහය ලබාදීම.
එක් රටක ජිවත් වන පුද්ගලයින්ට තවත් රටක ජීවත් වන පුද්ගලයින්ගෙන් ප්‍රතිලාබ ලබාගැනිමට හා ඔවුන්ව ආරක්‍ෂා කිරීමට නිතී නිර්මාණයකිරීම.


WORLD'S LARGEST LESSON
MAS CHANGE IS COURAGE
Eco go beyond EMPOWERING GENERATION NEXT WITH SUSTAINABILITY

## 11 ආරක්ෂාකාරී, සුනම්‍ය හා තිරසාර නගර හා මානව ජනාවාස ඇතිකිරීම




ප්‍රමාණවත් ආරක්ෂිත යෝග්‍ය නිවාස මූලික සේවා සහිත දියුණුකළ මුඩුක්කු නිවාස සඳහා 2030 වනවිට ප්‍රවේශයන් ඇතිකරලීම.
හානියටපත් පුද්ගලයින් ප්‍රමාණය හා මරණ ප්‍රමාණය හා මරණ ප්‍රමාණය 2030 වනවිට සැලකියයුතු ප්‍රමාණයකින් අවමකිරීම.
වායුගුණාත්වය, නාගරික තත්වය, කසල කළමණාකරනය පිළිබද අවධානය යොමු කරමින් 2030 වන විට නගරවල පවතින ඒක පුද්ගල පරිසර බලපෑම අවමකිරීම යනාදිය මෙහි ඉලක්කයන් අතර වේ.




විශේෂයෙන්ම ළමුන්ට කාන්තාවන්ට අසරණ පුද්ගලයින්ට නිර්මාණය කරනලද, පරිසරයට හානිනොවන සංවිධානාත්මක ආරක්ෂිත ප්‍රවාහණ සේවාවක් සැපයිම සිදුකල යුතුය.
මිනිසුන් ඕවුන්ගේ සම්පත් මනාලෙස කළමණාකරනය කිරීමට සහ දේශගුණික වෙනස්වීම් වලට මුහුණ දීමට සූදානම් කරවීම.

## 12 තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් ඇති කිරීම




තිරසර කළමණාකරනය සහ ස්වාභාවික සම්පත් වල කාර්යක්ෂමතාවය බාවිතයන් 2030 වනවිට තහවුරු කිරීම.
අවම කිරීම, නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රිකරණය යන 3R සංකල්පය තුලින් කසළ ජනනයවීම 2030 වනවිට අවමකිරීම.
මිලදි ගැනීම් සඳහා තිරසර ජාතික ප්‍රතිපත්ති මගින් ජාතික මිලදී ගැනීමේ ක්‍රියාකාරකම් ප්‍රචලිත කිරීම.
තිරසර සංවර්ධනය හා පරිසර හිතකාමී ජීවනරටාවන් පිළිබදව, දැනුම හා තොරතුරු පිළිබදව 2030 වනවිට සියලුදෙනාම දැනුවත් වීම යනාදිය මෙහි ඉලක්කයන් අතර වේ.




ඒ වාගේම සමාගම් හා පුද්ගලයින් මගින් සිදුවන අහාර අපතය වලක්වාගැනීමට මහා පරිමාණ සමාගම් වගකීමෙන් කටයුතු කල යුතු අතර පරිසර හිතකාමීව කටයුතු කලයුතුය.

## 13 දේශගුන විපර්යාස හා එහි බලපෑම් මැඩලීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම




ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග හා සැලසුම් කිරිමේදී දේශගුනික වෙනස්විම් සඳහා බලපාන සාධක ඇතුලත් කිරිම.

දේශගුනික සහ ස්වභාවික හානිකර විපත් සඳහා මහජනයා සූදානම් කරවීම.




රාජ්‍ය න්‍යාය පත්‍රයතුල දේශගුණික වෙනස්විම් සම්හන්ද ගැටළු සාකච්චාකළ යුතුඅතර, දේශගුණික වෙනස්විම් බලපෑම් අවම කිරිම සඳහා සම්පත් වෙන් කළයුතුය.

## 14 තිරසාර සංවර්ධනයක් උදෙසා සාගර, මුහුදු හා සමුද්‍රීය සම්පත් සංරක්ෂණය හා තිරසාර භාවිතය

සුංබුං එකතුකිරිම, එක් එක් රසායනික ද්‍රව්‍ය එකතු කිරිම වැනි සාමන්‍ය කටයුතු වලින් සිදුවන මුහුදු දූෂණය වළකා දැමීම.




සියලුම වැඩිදියුණු කළ විද්‍යාත්මක සහයෝගීතාවය තුළින් මුහුදු ආම්ලීකරණය අවම කිරිම සහ එහි බලපෑම් පිළිබදව සාකච්චාකිරිම.

විද්‍යාත්මක තොරතුරු මත පදනම්ව ජාතික හා අන්තර්ජාතික නීති සමග පවතින මුහුදු හා වෙරළ ප්‍රෙදේශ වලින් 2020 වනවිට අවම වශයෙන් 10% ක් සංරක්‍ෂණය කිරිම යනාදිය මෙහි ඉලක්කයන් අතර වේ.




නීතී විරෝධී මසුන් ඇල්ලීම සහ අනෙකුත් විනාශකාරී මසුන් ඇල්ලීමේ ක්‍රම 2020 දී වැළකවීම සඳහා නීතී සම්පාදනය කිරිම.

අනාගතය පිළිබද සලකාබලමින් දුගී දුප්පත් රටවල් සහ කුඩා දුපත් වලට මුහුදු සංරක්‍ෂණය සහ මුහුදු සම්පත් කළමනාකරණයට මූල්‍ය අධාර සැපයීම.

## 15 භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම, නැවත ඇතිකිරීම හා තිරසාර භාවිතයට පෙළඹවීම හා වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම හා කාන්තාරකරණය වැලකීම හා භූමි ඛාදනය වැලැක්වීම හා ජෛව විවිධත්වය නැතිවීයාම වලකාලීම.

වන විනාශය නැවතීම, විනාශ වු වනාන්තර ප්‍රතිස්ථාපනය කිරිම,රුක් රෝපණය ඉහල දැම්ම යන සියලුම වර්ගයේ තිරසර කළමණාකරනයන් 2020 වනවිට ක්‍රියාවටනැංවිම ප්‍රවර්ධනය කිරිම.




තිරසාර සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍යවන කදුකර පරිසර පද්ධති සංරක්‍ෂණය 2030 වනවිට සිදුකිරිම සහ එමගින් ප්‍රථිඵල ලබාගැනීමේ හැකියාව ඉහලනැංවීම.

ස්වාභාවික ජන්මභූමි ක්ෂයවීම අවමකිරීම සඳහා අවශ්‍යවන කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සහ වදවීමේ තර්ජනයට ලක්වී සිටින සත්ව විශේෂ වදවීම 2020 වනවිට වළකාලීම යනාදිය මෙහි ඉලක්කයන් අතර වේ.

කාන්තාර වැසිවනාන්තර වැනි පරිසර පද්ධති රැකගැනිම සහ සංරක්ෂණයට අන්තරජාතික ගිවිසුම් වලට ප්‍රවේශවීම.




**16 තිරසාර සංවර්ධනයක් සඳහා සියළුම දෙනා අයත්වන සාමකාමී සමාජයක් ඇති කිරීමට අනුබල දිය යුතු අතර, සැමටම නීතියේ සාධාරනත්වය ලබාදීමට සහ සියළුම මට්ටම් වලින් ඵලදායී, වගකීමක් සහිත ආයතන ඇති කිරීම.**




සෑම තැනකම මරණ අනුපාතිකය සම්භන්ද හා සියලුම අකාරයේ හිංසනයන් අවම කිරීම.
උපයෝජණය කිරීම, හොරකම්කිරීම, සියලුම අකාරයේ හිංසනයන්, ළමුන් සඳහා සිදුවන වදහිංසනයන් සහා නින්දාවන් අවසාන කිරීම.
සියලු දෙනාටම අධිකරණය වෙත යාමට සමාන අවස්ථාවක් ඇතිකරලීම සඳහා ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතී ක්‍රියාවට නැංවීම.
සියලුම අකාරයේ සිදුවන දූෂණයන් හා අල්ලස් ගැනීම් අවමකිරීම.
සියලුම තැන්වල කාර්යක්ෂම, විනිවිදභාවයකින් යුතු ආයතන සංවර්ධනය කිරීම.




උපත් ලියාපදිංචියද ඇතුළුව නීතීමය හඳුනාගැනීමේ ක්‍රමවේදයක් සියලුදෙනාටම සැපයීම යනාදිය මෙහි ඉලක්කයන් අතර වේ.

ප්‍රචණ්ඩක්‍රියා, අපරාධ සහ ත්‍රස්ත්‍රවාදී තත්වයන් නැතිකිරීම සඳහා ශක්තිමත් ආයතන පිහිටුවීම.
තොරතුරු සඳහා සියලූම පුද්ගලයින්ට ප්‍රවේශවීමට අවස්ථාවක් තිබිය යුතුය.


WORLD'S LARGEST LESSON MAS CHANGE IS COURAGE Eco go beyond EMPOWERING GENERATION NEXT WITH SUSTAINABILITY

## 17 තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාවය නැවත බල ගැන්වීම හා ක්‍රියාත්මක කිරීම




සියළුම රටවල් මෙම තිරසර සංවර්ධන අභිමථාර්ථ සපුරා ඇතිබවට 2030 වනවිට තහවුරු කිරීම.
සියළුම තිරසර සංවර්ධන අභිමථාර්ථ ජාතික සැලසුම් වල අන්තර්ගතවිය යුතු අතර අදාල රාජ්‍යන් විසින් තම දේශයට වැදගත් ලෙස බලපාන ගැටළු හදුනාගත යුතුය.
රාජ්‍යයන් වල ප්‍රතිපත්තිමය තීරණවලට ගරුකළ යුතුය. ප්‍රතිපත්ති ඒකාකාරීවිය යුතුය.
මෙම තිරසර සංවර්ධන අභිමථාර්ථ සම්භන්දයෙන්ද දීර්ඝකාලීනව කටයුතු කරන ආයතන සහ පුද්ගලයින්ගේ සහයෝගය ලබාගතයුතු අතර මෙම තිරසර සංවර්ධන අභිමථාර්ථ සපුරාගැනීමට ඔවුන්ගේ අත්දැකීම් ඉතා වැදගත් ලෙස ඉවහල් වේ.




2020 වනවිට සියලුම රාජ්‍යන් දත්ත හා සංඛ්‍යාලේඛණ කළමණාකරනයන් පවත්වාගෙන යා යුතු අතර එම දත්ත භාවිතා කර තිරසර සංවර්ධන අභිමථාර්ථවල ප්‍රගතිය මැනබැලීමට යොදා ගතයුතුය.
සියලුම රාජ්‍යයන් තිරසර සංවර්ධන අභිමථාර්ථ ලගාකර ගැනීම සඳහා සම්පත් වෙන්කළ යුතු අතර සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා මෙම අභිමථාර්ථ සපුරාලීමට සහයවිය යුතුය.